www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ග්‍රීක මහා වැඩ වර්ජනයේ ජාත්‍යන්තර අර්ථභාරය

## The international significance of the Greek general strike

2010 මැයි 10

ග්‍රීක මහා වැඩ වර්ජනය ද දිගින් දිගටම එරට පවත්නා මහා විරෝධතා ව්‍යාපාරය ද යුරෝපය සහ ලෝකය පුරා පැන නගිමින් තිබෙන යෝධ පන්ති අරගලයන් පිළිබඳ පෙර ලකුනු ය.

ග්‍රීක අරගලය පැන නැගී ඇත්තේ එරට සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී අගමැති ජෝර්ජස් පැපැන්ද්‍රියෝ සමග යුරෝපා සංගමය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇති කර ගත් කප්පාදු ගිවිසුමට එරෙහිව ය. පැපැන්ද්‍රියෝගේ පිළිවෙතට එරෙහි කටුක විරුද්ධත්වයක් ග්‍රීක කම්කරු පන්තිය තුල පවතී. ලක්ෂ ගනන් රැකියා කපා දමන්නට ද, සමාජ සේවා හා විශ්‍රාම වැටුප් කපා දමන්නට ද පැපැන්ද්‍රියෝගේ ආන්ඩුව සපථ කර සිටී.

පසුගිය සතියේ මූල්‍ය අර්බුදයට එරෙහි විරෝධතා පැතිර යනු ඇතැයි ද කම්කරුවන් මත කප්පාදු පැටවීමට පැපැන්ද්‍රියෝ ආන්ඩුව අසමත් වනු ඇතැයි ද ආයෝජකයන් බිය වූ තතු තුල ග්‍රීක කොටස් වෙළඳ පල බිඳ වැටුනි.

මෙම සිද්ධීහු විප්ලවවාදී ජාත්‍යන්තර විපාක දනවති. පෘතුගාලය, ස්පාඤ්ඤය සහ වෙනත් යුරෝපීය රටවල්වලට එරෙහිව ආයෝජකයන්ගේ සමපේක්ෂනය උග්‍රවෙත්ම, වැඩිවැඩියෙන් පැහැදිලි වන්නේ ලෝකය පුරා කම්කරුවන්ට තනි සතුරෙකුට මුහුන දීමට සිදුව ඇති බවය; ඒ සතුරා නම් කම්කරුවන් මත්තේ දැවැන්ත රැකියා කප්පාදු, වැටුප් කප්පාදු සහ සමාජ සේවා කප්පාදු කඩාපාත් කිරීමට ලෝකයේ සෑම රටකම වලිකන පරපුටු ධනපති පාලක පන්තියයි. ඔවුහු බිඳ වැටෙන බැංකු පද්ධතිය බේරා ගැනීම සඳහා තමන්ගේ ආන්ඩු විසින් වගුරන ලද මහා ධනස්කන්ධය කාබී තර ව එම වියදම කම්කරුවන්ගේ කරපිටින් යැවීමට වෙර දරති.

ග්‍රීක වැඩ වර්ජනවල ජාත්‍යන්තර අර්ථභාරය දැනුදු බොහෝදෙනා පිලිගනිති. *නිව්යෝර්ක් ටයිම්ස්* පුවත් පතේ ලේඛක තෝමස් ෆ්‍රීඩ්මාන් ග්‍රීක විරෝධතා ගැන මෙසේ අනතුරු හැගවී යඃ

"මේක අපට අදාල නැතැයි සිතනවා ද? හොඳයි, අපි මෙතැන මඩුබහිමින් තිබෙන නාටකය දෙස බලමු. මේ නාටකය ඔබට වඩාත් අසන්න කරලියකට එන්නට හොඳටම ඉඩ තිබේ." ඔහු මෙසේ ද කීය, ග්‍රීසියට පමනක් නොව එක්සත් ජනපදයට ද "වැටුප් සහ සහන කප්පාදු පැනවීමට සිදුවනු ඇතඃ"

ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපීය රටවල මෙන් ම ග්‍රීසියේ ද රාජ්‍ය නය වැඩිහරියක් කඳුගැසී තිබෙන්නේ බැංකු බේරාගැනීමට ආන්ඩු සැපයූ ධනස්කන්ධය නිසාය. ඇතන්ස් නුවර ග්‍රීක ආන්ඩුව එරට බිඳවැටෙන බැංකු ගොඩගැනීම සඳහා කම්කරුවන්ගෙන් කපා ගත් යුරෝ බිලියන 28ක් යට කලේය. දැන් වර්ෂයකට යුරෝ බිලියන 30 ගනනේ කම්කරුවන්ගෙන් කපා ගැනීමට ග්‍රීක ආන්ඩුව තීන්දු කර ඇත. එසේම යුරෝපීය ආන්ඩු ද තමන්ගේ අයවැය ලේඛන මගින් යුරෝ බිලියන දස දහස් ගනන් කපා ගැනීමට සූදානම් වෙමින් සිටියි.

පසුගිය ජනවාරි - මාර්තු සමයේ බැංකුකරුවෝ දැවැන්ත ලාභ ගරා ගැනීම සඳහා ග්‍රීක රාජ්‍ය නයේ පොලිය වැඩි කිරීමට මානබැලූහ. පැපැන්ද්‍රියෝ සූදානම් කරමින් තිබුනු සමාජසේවා කප්පාදු වලින් තම ගාස්තු අය කර ගත හැකි යයි ඔවුහු ගනන් බැලූහ. එහෙත් මේ සැලැස්ම දැන් බිඳ වැටී ඇත.

කම්කරුවෝ කප්පාදුවලට විරුද්ධව සටනට බැස්සාහ; මේ අතර යුරෝපීය ආන්ඩු ග්‍රීසියට ඇප දීමේ කොන්දේසි මොනවා ද යන්න ගැන කුලල් කා ගත්හ, මේ අතර බැංකු පොලී කොතරම් ඉහල මට්ටමකට නැංගේ ද කියතොත්, සකල ප්‍රායෝගික අර්ථයකින් ම ග්‍රීසිය බංකොලොත්වී ගියේ ය. අවුරුදු තුනක යුරෝ මිලියන 110ක ඇප දීමේ සැලැස්ම ග්‍රීසිය ක්‍රියාත්මක කලත් බිඳ වැටීම වැලැක්විය නොහැකි වනු ඇත. යුරෝපීය හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නියමිත කප්පාදු ග්‍රීක ආර්ථිකය සියයට 30 කින් බිඳ දමනු ඇත. ඒ අනුව ග්‍රීසියේ නය දැන් පවත්නා යුරෝ බිලියන 300 ඉක්මවා තව තවත් වැඩි වනු ඇත.

ග්‍රීක අර්බුදය සමස්ත යුරෝපීය අර්බුදයක් ලෙස මෝරා ගොස් ලෝක ආර්ථිකයටම තර්ජනය කරයි. දැන් පෘතුගාලයට, ස්පාඤ්ඤයට, එක්සත් රාජධානියට සහ වෙනත් රටවලට නය දෙන්නට බැංකු වැඩිවැඩියෙන් බිය වෙති. රුමේනියාව, බල්ගේරියාව

සහ සර්බියාව වැනි අස්ථාවර දැනටම දිලිඳුබවේ ගිලීඇති බෝල්කන් රටවල් සම්බන්ධයෙන් නය දෙන්නෙකු ද, අපනයන වෙලඳපලක් ද ඒ රටවලින් සංක්‍රමනය වන කම්කරුවන්ට රැකියා තිප්පලක් ද ලෙස ග්‍රීසිය දරන තැන නිසා, එම රටවල් මුලුමනින්ම නට්ටම් කර දැමීමට අර්බුදය තර්ජනය කරයි.

යුරෝපීය ආන්ඩු බංකොලොත් වනු ඇතැයි සැකය නිසා ද බැංකු ම විශාල මුදල් කන්දරාවක් නැති කරගනු ඇතැයි සිතන නිසා ද එක බැංකුවක් අනෙක් බැංකුවට නය දීමට බියෙන් සිටිති. මෙය (2008 මහා නය බිඳවැටීම ඉක්මවන) අලුත් නය ඇනහිටීමක් පැන නැංවීමට තර්ජනය කරසිටී. යුරෝපීය සංගමයේ මුදල් කටයුතු භාර ඔල්ලි රෙහ්න් මෙසේ අනතුරු හැඟවී යඃ "ග්‍රීසියේ බංකොලොත්කම 2008 ලෙහ්මන් බ්‍රදර්ස් මූල්‍ය සමාගමේ බිඳ වැටීමට සමානය; නැතිනම් ඊටත් වඩා නරක ය."

බැංකුවල සිටිනා ග්‍රීසියේ නය කාරයන්ට (යුරෝපීය සංගමය) දැන් ගෙවන්නට යන 'ග්‍රීක් ඇපය' කම්කරු පන්තියෙන් දෙගුනව අය කර ගැනෙනු ඇත. පලමුව, 'ඇපය' ගෙවන රටවල කම්කරුවන්ගෙනි. දෙවනුව, ග්‍රීසියේ ම කම්කරුවන්ගෙනි. මේ දෙ විධියට ම එය දැවැන්ත කප්පාදු වලට හේතුව ලෙස යොදා ගැනෙනු ඇත.

ලෝක ධනේශ්වර අර්බුදය උග්‍රවත් ම, සමාජ සට්ටනය ද උග්‍ර වනු ඇත; පාලක පන්තිය වඩවඩාත් විවෘත ඒකාධිපති පාලනයන් කරා මාරු වනු ඇත. දැනටමත්, "ත්‍රස්ත විරෝධී යුද්ධයේ" නාමයෙන් මෙවන් පියවරයන් යුක්තිසහගත කරනු ලැබ තිබෙන අතර වඩවඩාත් විවෘතව මහජන විරෝධතාවලට එරෙහිව යෙදෙනු ඇත.

ග්‍රීක බ්‍රිගේඩියර් ස්ටයිලියනෝස් පැටකෝස් සමග බ්‍රිතාන්‍යයේ *ඔබ්සර්වර්* පුවත්පත 9වන ඉරිදා සම්මුඛ සාකච්ඡාවක් පැවැත්විය. 1967-1974 දක්වා ග්‍රීසිය පාලනය කල මිලිටරි ජුන්ටාවේ තවමත් ජීවත්ව සිටින එකම සාමාජිකයා වූ පැටකෝස් ජුන්ටා පාලනයේ වාර්තාව ප්‍රසංශාවට ලක් කලේ ය. "අප කරද්දී රාජ්‍ය නයක් තිබුනේ නැත. එකම ඩ්‍රැක්මා කාසියක්වත් නාස්ති වූයේ නැත. ග්‍රීකයෝ බ්‍රිතාන්‍ය හෝ ජර්මානුන් මෙන් හික්මුනු ජාතියක් නොවෙති. ඔවුන් පාලනය කිරීමට දැඩි අධිකාරයක් උවමනාය." ඔහු මෙසේද කීය. "අප දැන් ඉන්නේ දේශපාලන සිද්ධි දාමයේ මැද හෝ අග නොවේ; මුල ය."

ග්‍රීසියේ හෝ පිට රටවල බැංකු ඇප දී බේරා ගැනීමට විරුද්ධ කම්කරුවන් මුහුන දී සිටින්නේ පොදු ලෝක අර්බුදයකට ය. එහෙයින් ඔවුන්ට ජාත්‍යන්තර මූලෝපායක් තිබිය යුතු ය.

කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන මූලෝපායක් වෘත්තීය සමිති සමග ද මධ්‍යම පන්තික සංවිධාන සමග ද ඉක්මනින්ම ගැටෙනු ඇත. එම සංවිධාන සියල්ලම ක්‍රියාකරන්නේ කම්කරුවන්ගේ විරෝධතාවය දියකර හැරීමට ය.

ග්‍රීසියේ වෘත්තීය සමිති ද කොමියුනිස්ට් පක්ෂය සහ සයිරිසා ඇතුලු වෘත්තීය සමිතිවල මිත්‍රයෝ ද පැපැන්ද්‍රියෝ සමග තම හවුල පවත්වාගෙන යෑමට සහ දේශපාලන සංස්ථාපිතය තුල තම භූමිකාව පවත්වාගෙන යාමට තීන්දු කරගෙන සිටිති. ඔවුහු පැපැන්ද්‍රියෝගේ අපේක්ෂකත්වයට ආධාර කලහ. ඔහු සමග දේශපාලන තත්වය ගැන ද ග්‍රීක ධනපති පාලනය ඇප දී බේරාගැනීමට යුරෝපීය සංගමය හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ගෙන තිබෙන පියවර හා කොන්දේසි පිලිබඳව ද පැපැන්ද්‍රියෝ සමග නිරතුරුව සාකච්ඡා කරති.

පැපැන්ද්‍රියෝගේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පැසොක් පක්ෂයට බලපෑම් දමා කම්කරුවන්ගේ වාසියට යොදාගත හැකිය යන මිථ්‍යා ඉදිරි දර්ශනය වගාකිරීම මගින් මොවුහු - වෙනත් රටවල සිටිනා ඔවුන් වැන්නන් මෙන්ම - රාජ්‍යයට ද ජාතිකවාදී දේශපාලනයට ද බැංකුකරුවන්ගේ බඩගිනි සැලසුම්වලට ද, කම්කරු පන්තිය යටත් කිරීමට දැනුවත්වම ක්‍රියා කරති.

උග්‍රවන ධනේශ්වර බංකොලොත් භාවයේ තර්ජනය දෙකින් එකක් බේරාගැනීම පිලිබඳ ප්‍රශ්නය තියුනු ලෙස මතු කරයිඃ එක්කෝ පාලක පන්තිය කම්කරුවන් දිලිඳුබවට හා සාගින්නට ඇද දමා ධනපති දේපල රැක ගනු ඇත. එසේ නැතහොත්, කම්කරුවන් ධනපති දේපල තමන් අතට ගනු ඇත. කම්කරුවන් මුහුන දී සිටින අරගලවල ඓතිහාසික අර්ථභාරය වහා වටහා ගත යුතුය. ඔවුන් මුහුන දී සිටින අභියෝගය එයයි.

බැංකු කම්කරු පන්තියේ පාලනය යටතට ගෙන පොදු දේපල බවට පත් කල යුතු ය. නිෂ්පදනය පොදුවේ සමාජයේ අවශ්‍යතාවය සඳහා මිස පුද්ගලික ලාභය සඳහා නොවිය යුතු ය. මෙය වනාහී විප්ලවීය සමාජවාදයේ ඉදිරි දර්ශනයයි. ආර්ථිකයේ ප්‍රධාන මර්මස්ථාන පුද්ගලික දේපල අයිතියෙන් හා ලාභය ගැරීමේ අරමුනින් ද ජාතික-රාජ්‍ය පද්ධතියෙන් ද ගලවා ගත යුතුය.

සමාජ සුබසාධනය විනාශ කර දැමීමට දත්මිටි කා සිටින ධනේශ්වර ආන්ඩුවලට බලපෑම් දැමීම යුරෝපයේ කම්කරුවන්ගේ දේශපාලන කර්තව්‍යය නොවේ. කම්කරුවන් ඒවා ඉවත් කර දමා සමස්ත යුරෝපීය සමාජවාදී සමූහාන්ඩු සංගමයක් ගොඩනැගිය යුතු ය.

ඇලෙක්ස් ලැන්ටියර්

© www.wsws.org